**බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ වන**

**කළුතර සහ මීරිගම ජ්‍යෙෂ්ඨ පුරවැසි සුබසාධන සේවා මධ්‍යස්ථාන සඳහා**

**2026 වර්ෂයට සම්පත්දායකයන් බඳවා ගැනීම**

බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ වන කළුතර සහ මීරිගම ජ්‍යෙෂ්ඨ පුරවැසි සුබසාධන මධ්‍යස්ථානය සඳහා 2026 වර්ෂයට සම්පත්දායකයන් බඳවා ගැනීම සඳහා පහත පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

පොදු කොන්දේසි

- වයස අවුරුදු 25ත් 60ත් අතර ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
- මනා චරිතයකින් හෙබි විය යුතු වීම
- අදාල විෂය සම්බන්ධ මාස 6කට නොඅඩු ඉගැන්වීම සම්බන්ධ පළපුරුද්ද සහිත වීම

පවත්වන වැඩසටහන් හා අවශ්‍ය සුදුසුකම්

**1.ශරීර සුවතා හා ශාරීරික අභ්‍යාස**

- ක්‍රීඩා හා/හෝ ශාරීරික අභ්‍යාස ක්‍රීඩා කළමනාකරණය පිළිබඳ උපාධිය හෝ
- ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ උසස් ජාතික ක්‍රීඩා ඩිප්ලෝමාව හෝ
- ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ ක්‍රීඩා ඩිප්ලෝමාව
- ක්ෂේත්‍රය තුල ලබා ඇති පළපුරුද්ද තහවුරු කරන ලිපි ලේඛන

**2. යෝග පුහුණු වැඩසටහන්**

- පිළිගත් ආයතනයකින් යෝග සම්බන්ධ ඩිප්ලෝමාවක් හදාරා තිබීම හෝ ඊට ඉහළ සුදුසුකම්
- ක්ෂේත්‍රය තුල ලබා ඇති පළපුරුද්ද තහවුරු කරන ලිපි ලේඛන

**3. නර්ථන පුහුණු වැඩසටහන්**

- ලලිතකලාවේදී (නර්ථන) උපාධිය හෝ නර්ථනය ප්‍රධාන විෂයක් ලෙස හදාරා ඇති උපාධියක්
- ක්ෂේත්‍රය තුල ලබා ඇති පළපුරුද්ද තහවුරු කරන ලිපි ලේඛන

**4. මැහුම් හා අත්කම්**

- විෂය සම්බන්ධ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකම්
- ක්ෂේත්‍රය තුල ලබා ඇති පළපුරුද්ද තහවුරු කරන ලිපි ලේඛන

**5. සංගීත චිකිත්සක**

- ප්‍රාසාංගික කලාවේදී උපාධිය (සංගීතය) සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය හෝ
- ලලිතකලාවේදී උපාධිය (සංගීත) කැළණිය විශ්ව විද්‍යාලය /ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හෝ
- ශාස්ත්‍රිය සංගීතය සහ ව්‍යවහාරික සංගීතය පිළිබඳ වෙනත් පිළිගතහැකි ආයතනයකින් (ජාතික තරුණ සේවා සභාව / රාජ්‍ය සංගීත කණ්ඩායම / ගුවන් විදුලි සංස්ථා වාදක කණ්ඩායම)
- සංගීත ගුරුවරයෙක් ලෙස ක්ෂේත්‍රය තුල ලබා ඇති පළපුරුද්ද
- විශාරද සහතිකය අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

**වෙනත්**

- බඳවා ගනු ලබන සියළුම සම්පත් දායකයන් බස්නාහිර පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ සමග ගිවිසුමකට එළඹිය යුතුය.
- අයදුම්පත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය. www.ssd.wp.gov.lk
- සුදුසුකම් ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව 2026.01.01 දින සිට වසරක කාලයක්, සතියකට සමාජ සේවා අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබන පැය ගණනක් සේවය සැපයිය යුතුය.
- ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි "කළුතර / මීරිගම ජ්‍යෙෂ්ඨ පුරවැසි සුබසාධන සේවා මධ්‍යස්ථානය සඳහා සම්පත් දායකයන් බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම " යනුවෙන් සඳහන් කල යුතුය.
- නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් "අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව (බ.ප.), 204, 3 වන මහළ, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට 2025.12.15 දින සවස 4.00ට පෙර ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය.
- මෙම බඳවා ගැනීම සම්බන්ධ අවසාන බලධාරීත්වය බස්නාහිර පළාත් සමජ සේවා අධ්‍යක්ෂ සතුවේ.

**අධ්‍යක්ෂ**
**සමාජ සේවා දෙපාර්තමේන්තුව (බ.ප.)**

විශේෂ -
ජ්‍යෙෂ්ඨ පුරවැසි සුබසාධන සේවා මධ්‍යස්ථාන පිහිටා තිබෙන්නේ පහත ලිපිනයන්හි වන අතර ඔබ විසින් ප්‍රවාහන පහසුකම් සපයා ගත යුතු බව වැඩිදුරටත් සඳහන් කරමි.

<u>කළුතර ජ්‍යෙෂ්ඨ පුරවැසි සුබසාධන සේවා මධ්‍යස්ථානයේ ලිපිනය</u>
5 වන පටුමග
ගොවිජන සේවා මාවත
නාගොඩ
කළුතර

<u>මීරිගම ජ්‍යෙෂ්ඨ පුරවැසි සුබසාධන සේවා මධ්‍යස්ථානයේ ලිපිනය</u>
තවලම්පිටිය පාර
මීරිගම